නත්තල් සතියේ පැමිණෙන ඉරුදින

# ශුද්ධ වූ පවුලේ මංගල්‍යය

(නත්තල් මංගල්‍යය ඉරුදිනක වැටේ නම් දෙසැම්බර් 30)

## පළමුවන දේව ප්‍රකාශනය උත්පත්ති 15: 1-6, 21: 1-3

*උත්පත්ති පොතෙන් උපටා ගත් කොටසකි.*

තුඹට දාව උපන් තුඹේ ම දරුවෙක් තුඹේ උරුමකරු වන්නේ ය.

කලකට පසු සමිඳාණන් වහන්සේ ආබ්‍රම්ට දර්ශනය වී, පණිවුඩයක් දෙමින්, “ආබ්‍රම්, බිය නොවන්න: තුඹ රක්නා පලිහ මම ය: තුඹේ වාසනාව අති විසල් ය” යි වදාළ සේක. එහෙත්, ආබ්‍රම් උත්තර දෙමින්, “මහෝත්තම දෙවි ස්වාමිනී, දරුවෙකු නැති මට, ඔබ වහන්සේ වෙන කුමක් දුන්නත් කුමන පලක් ද? මාගේ උරුමකරු දමස්කස්හි එලියේසර් වන මොහු ය. ඔබ මට දරු සම්පත් දී නැත. එබැවින් මාගේ ගෙදර උපන් වහලෙක් මාගේ උරුමකරු වන්නේ ය” යි කී ය. එවිට සමිඳාණන් වහන්සේ නැවතත් ඔහු අමතමින්, “මෙවැන්නෙක් තුඹේ උරුමකරු නොවන්නේ ය. තුඹට දාව උපන් තුඹේ ම දරුවෙක් තුඹේ උරුමකරු වන්නේ ය” යි වදාළ සේක. සමිඳාණන් වහන්සේ ද ඔහු පිටතට රැගෙන ගොස්, “අහස දෙස බලා, හැකි නම්, ඔය තාරකා ගණන් කරන්න: තුඹේ දරු පරපුරත් එසේ ම වන්නේ ය”යි වදාළ සේක. ආබ්‍රම් ද සමිඳාණන් වහන්සේ අදහා ගත්තේ ය. ඒ ඇදහිල්ල ඔහුගේ ධර්මිෂ්ඨකම වශයෙන් උන් වහන්සේ පිළිගත් සේක.

තවද, සමිඳාණන් වහන්සේ වදාළ පරිදි උන් වහන්සේ සාරාට කරුනාව දැක්වූ සේක, උන් වහන්සේ ඇට දුන් පොරොන්දුව ඉටු කළ සේක. සාරා ද පිළිසිඳගෙන, දෙවියන් වහන්සේ වදාළ නියමිත කාලයෙහි, ආබ්‍රහම්ගේ මහලු වයසෙහි ඔහුට දාව පුත්‍රයෙකු ලැබුවා ය. ආබ්‍රහම්, තම පුත්‍රයාට ඊසාක් යන නම තැබී ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 105: 1–6, 8, 9

පිළිතුර: දෙවි සමිඳාණන්ගේ ගිවිසුම සදහට ම සිහි කරන්න.

ගීය : සමිඳුන්ට තුති පුදන්න, එතුමන්ගේ නාමයෙන් අයදින්න,
ජාතීන් අතරේ එතුමන්ගේ ක්‍රියා පළ කරන්න.
එතුමන්ට ගී ගයන්න: එතුමන්ට පසස් ගී ගයන්න.
එතුමන්ගේ පුදුම ක්‍රියා මෙනෙහි කරන්න.

එතුමන්ගේ ශුද්ධ නාමය ගැන උදන් අනන්න:
සමිඳාණන් සොයන්නන්ගේ සිත් ප්‍රීති ප්‍රමුදිත වේ වා!
සමිඳාණන් ද එතුමන්ගේ බලය ද සොයා බලන්න.
එතුමාණන් හමුව නිතර ම සොයන්න.

එතුමන්ගේ මෙහෙකරුවන් වූ ඉශ්රායෙල් වංශයෙනි,
එතුමන් තෝරාගත් ජාකොබ්ගේ දරුවෙනි,
එතුමන් කළ පුදුම ක්‍රියා ද එතුමන්ගේ ආශ්චර්යයන් ද
එතුමන් දුන් විනිශ්චයයන් ද සිහි කරන්න.

එතුමන් පරම්පරා දහසක් දක්වා අණ කළ
සිය ගිවිසුම සදහට ම සිහි කරන සේක.
ඒ ගිවිසුම එතුමාණෝ ආබ්‍රහම් සමඟ කළ සේක.
ඊසාක්ට ද දිවුරුම් දුන් සේක.

## දෙවන දේව ප්‍රකාශනය හෙබ්‍රෙව් 11: 8, 11, 12, 17–19

*හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද ලිපියෙන් උපුටා ගත් කොටසකි.*

### ආබ්‍රහම්, ඊසාක්, සාරා තුළ තිබූ ඇදහිල්ල

ඇදහිල්ලෙන්, ආබ්‍රහම් කැඳවීම ලැබූ කළ, තමා යන්නේ කොහේ දැ යි නොදැන, තමාට උරුමයක් පිණිස පසුව ලැබෙන්නට යන ස්ථානයකට පිටත් ව යන ලෙස කීකරු වී, නික්ම ගියේ ය.

ඇදහිල්ලෙන්, සාරා පොරොන්දුව දුන් තැනැන් වහන්සේ විශ්වාස කටයුතු කෙනෙකැ යි පිළිගත් නිසා, තිසි වයස ඉක්මවා ගිය ද, පිළිසිඳගැනීමේ ශක්තිය ලැබුවා ය. එහෙයින් මළ කෙනෙකු වැනි තැනැත්තකුගෙන් පවා, ගණනින් අහසේ තරු මෙන් ද, මුහුදු වෙරළේ අසංඛ්‍ය වැලි ඇට මෙන් ද වූ විශාල පරපුරක් ඇති විය.

ආබ්‍රහම් පරීක්ෂා කරනු ලැබූ කල, ඔහු ඇදහිල්ලෙන් ඊසාක් පූජා කළේ ය. "ඔබේ වංශය ඊසාක්ගෙන් පැවත එන්නේ ය." යන දේව පොරොන්දුව ආබ්‍රහම් සතුටින් පිළිගත් නමුත්, සිය ඒකජාතක පුත්‍රයා පූජා කිරීමට සූදානම් ව සිටියේ ය. මළවුන් උත්ථාන කිරීමට වුව ද දෙවියන් වහන්සේට හැකි බව ඔහු සිතට ගත්තේ ය. උපමානු සාරයෙන් කියතොත්, ඔහු ඊසාක් මරණයෙන් නැවත ලබාගත්තේ ය.

*දේව වචනය මෙසේ ය.*

## සුසුපුවත් ජය නද — හෙබ්‍රෙව් 1: 1–2

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ ආදි යුගවල දී නොයෙක් විට ද,
විවිධාකාරයෙන් ද දිවැසිවරයන් මඟින්
අපේ පියවරුන්ට කතා කළ සේක.
එහෙත් දැන් මේ අවසාන කාලයේ දී
උන් වහන්සේ සිය පුත්‍රයාණන් මඟින්
අපට කතා කළ සේක.
ආලේලූයා!

## සුවිශේෂය — ලූක් 2: 22–40

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### දරුවා වැඩී ශක්තිමත්ව ප්‍රඥාවෙන් පූර්ණ විය.

මොසෙස්ගේ ව්‍යවස්ථාව අනුව ඔවුන්ගේ පවිත්‍ර වීමේ කාලය පැමිණියෙන්, ඔව්හු උන් වහන්සේ සමිඳාණන් වහන්සේට කැප කරනු වස්, ජෙරුසලමට ගෙනාහ. එසේ කළේ, "හැම කුළුඳුල් පිරිමි දරුවෙක් ම සමිඳාණන් වහන්සේට කැප ය" යි සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථාවලියෙහි ලියා ඇති ලෙස, දරුවා සමිඳාණන් වහන්සේට ඔප්පු කරන පිණිසත්, එහි ම කියා ඇති පරිදි කොබෙයියන් දෙදෙනෙකු හෝ පරෙවි පැටවුන් දෙදෙනෙකු හෝ පූජා කරන පිණිසත් ය.

එකල, සිමියොන් නම් මිනිසෙක් ජෙරුසලමෙහි විසී ය. ඔහු ඉශ්‍රායෙල්වරුන්ගේ විමුක්තිය අපේක්ෂාවෙන් සිටි දැහැමි බැතිමතෙකි. ශුද්ධාත්මයාණෝ ඔහු කෙරෙහි වැඩ හුන්හ. ස්වාමින් වහන්සේ අභිෂේක කල “ක්‍රිස්තුස් වහන්සේ දක්නට පළමුවෙන් ඔහු මරණය නොදක්නේය” යි ශුද්ධාත්මයාණන් විසින් ඔහුට අනාවරණය කරනු ලැබ තිබිණි. ඔහු ශුද්ධාත්මානුභාවයෙන් දේව මාළිගාවට පැමිණියේ ය. ළදරු ජේසුස් වහන්සේ පිළිබඳ ව ව්‍යවස්ථාවෙහි සඳහන් වත් පිළිවෙත් ඉටු කරනු වස්, දෙමවුපියන් උන් වහන්සේ ගෙනා විට, ඔහු උන් වහන්සේ දෝතින් වඩාගෙන මෙසේ දෙවියන් වහන්සේට ප්‍රශංසා කළේ ය. “සමිඳුනි, ඔබ පොරොන්දු වූ ලෙස ම දැන් ඔබ දාසයා හට, ශාන්ති සිතින් යාමට ඔබ නිදහස දී ඇත. මන්ද, ගැළවීම මාගේ දෙනෙතින් දිටිමි. එය සකල ජාතීන් අබිමුව කළ ගැළවීම ද විජාතීන්ට එළිය දෙන ආලෝකය ද ඔබේ සෙනඟ වන ඉශ්‍රායෙල්වරුන්ගේ මහිමය ද වේ.”

උන් වහන්සේ පිළිබඳ ව කී දේ ගැන උන් වහන්සේගේ පියා ද මවු ද මවිත වූ හ. සිමියොන් ඔවුන්ට ආශිර්වාද කරමින් උන් වහන්සේගේ මව වූ මරිය තුමීට කතා කොට, “මේ දරුවා ඉශ්‍රායෙල්හි බොහෝ දෙනෙකුගේ වැටීම හා නැඟීම පිණිසත්, ප්‍රතික්ෂේපයට ලක් වන දේව සළකුණක් වන පිණිසත් නියම ව සිටී. එසේ ය, ඔබේ ම හදවත කඩුවකින් අනිනු ලැබුවාක් මෙන් තුවාල වනු ඇත. මෙසේ වන්නේ, බොහෝ දෙනෙකුගේ සිත්හි රහස් කල්පනා එළිදරව් වන පිණිස ය” යි කී ය.

තවද, ආෂෙර්ගේ පෙළපතින් ආ පානුවෙල්ගේ දුවක වන බොහෝ වයස්ගත අන්නා නම් දිවැසිවරියක් වූවාය. විවාහයෙන් පසු සත් වසක් සැමියා සමඟ විසූ ඇ අසූහතර අවුරුද්දක් වයස් වන තුරු වැන්දඹුවක්ව සිටියා ය. ඇ දේව මාළිගාවෙන් ඉවත් ව නො ගොස් දිවා රෑ දෙක්හි උපවාස හා යාච්ඤා පවත්වමින් නමස්කාර කළා ය. ඇ ද ඒ මොහොතේ දී ම අවුත්, දෙවියන් වහන්සේට තුති පුදා, ජෙරුසලමේ විමුක්තිය අපේක්ෂා කළ සියලු දෙනා හට උන් වහන්සේ ගැන කතා කළාය.

ජෝසෙප් සහ මරියා සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථාවලිය අනුව සියල්ල ඉටු කළ පසු ගලීලයෙහි නාසරෙත් නම් සිය නුවරට පෙරළා ගියහ. දරුවා වැඩී ශක්තිමත් ව ප්‍රඥාවෙන් පූර්ණ විය: දෙවියන් වහන්සේගේ ප්‍රසාදය ද උන් වහන්සේ කෙරෙහි විය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*